මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | විදේශ විනිමය දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022.07.08 |

## විදේශ ව්‍යවහාර මුදල් වල හිමිකාරීත්වය පිළිබඳව නිකුත් කර ඇති නියමය බලපැවැත්වෙන කාල සීමාව දීර්ඝ කිරීම

ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික පුද්ගලයන් සන්තකයේ පවතින විදේශ ව්‍යවහාර මුදල් බලයලත් වෙළෙන්දකු (බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුව) වෙත තැන්පත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදානය කරන ලද පොදු සමාකාලය 2022.07.26 දින දක්වා, තවත් වැඩකරන දින 14 ක කාලයක් සඳහා දීර්ඝ කරමින් මුදල් අමාත්‍යවරයා විසින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වැනි වගන්තිය යටතේ නියමයන් නිකුත් කර ඇත.

වැඩිදුර විස්තර සඳහා 2022.07.05 දිනැති අංක 2287/16 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශ විනිමය පනතේ 8 වැනි වගන්තිය යටතේ වන නියමය www.dfe.lk හරහා බාගත කිරීමෙන්/ පිවිසීමෙන් පරිශීලනය කළ හැක.